ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව
உள்நாட்டு தொழிற்பாடுகள் திணைக்களம்
Domestic Operations Department

**චක්‍රලේඛ අංක : 35/03/016/007/005**

2020 පෙබරවාරි 11

සියලුම සහභාගිත්ව ආයතනවල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත

**විවට වෙළඳ කටයුතු යටතේ වන ස්ථිර පදනම මත වෙන්දේසි**

2016 ඔක්තෝබර් 26 දින නිකුත් කරන ලද *වෙළඳපොළ කටයුතු සඳහා වන ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස්* චක්‍රලේඛ අංක 35/03/016/007/001 හි අංක 83.0 වගන්තිය 2019 සැප්තැම්බර් 05 දින නිකුත් කරන ලද *විවට වෙළඳ කටයුතු යටතේ වන ස්ථිර පදනම මත වන වෙන්දේසිවලට* අදාළ චක්‍රලේඛ අංක 35/03/016/007/004 මගින් සංශෝධනය කරන ලද අතර, 2020 පෙබරවාරි 11 වන දින සිට බලපැවැත්වෙන පරිදි තවදුරටත් පහත අයුරින් සංශෝධනය වනු ඇත.

**83.0 (ආ) භාණ්ඩාගාර බැඳුම්කර යටතේ වෙන්දේසි නිවේදනය කිරීම**

මහ බැංකුව විසින් ස්ථිර පදනම මත වන වෙන්දේසි පැවැත්වීම නිවේදනය කිරීම එම වෙන්දේසි පැවැත්වීමට අවම වශයෙන් එක් ව්‍යාපාරික දිනකට පෙර සිදු කරනු ලබයි. එම නිවේදනය, අදාළ වෙන්දේසියේ වර්ගය (ස්ථිර පදනම මත විකිණීම හෝ මිලට ගැනීම), පිරිනමනු ලබන ප්‍රමාණය (අදාළ සුරැකුම්පතෙහි මුහුණත වටිනාකම), පරිණත වන දිනය, පරිණත වීම සඳහා ඇති දින ගණන, වෙන්දේසි පවත්වනු ලබන දිනය සහ පියවීමේ කටයුතු සිදුවන දිනය යනාදී තොරතුරුවලින් සමන්විත වේ. ස්ථිර පදනම මත සිදු කරන වෙන්දේසිවල පියවීම් කටයුතු වෙන්දේසි පැවැත්වූ දිනට පසු එළඹෙන පළමු ව්‍යාපාරික දිනයේදී සිදු කරනු ලැබේ.

**අධ්‍යක්ෂ/දේශීය මෙහෙයුම් කටයුතු**

7 වන මහල, 2 වන කුළුණ
අංක 30, ජනාධිපති මාවත
තැ.පෙ. 590, කොළඹ 01, ශ්‍රී ලංකාව

தளம் 7, கோபுரம் 2
இல. 30, சனாதிபதி மாவத்தை
த.பெ 590, கொழும்பு 01, இலங்கை

Level 7, Tower 2
No. 30, Janadhipathi Mawata
P.O. Box 590, Colombo 01, Sri Lanka

+94 112 477036 | +94 112 346287 | ddod@cbsl.lk | www.cbsl.gov.lk